පිරිත් පිංකම

ශ්‍රී ලංකා බෞද්ධ විහාරය පර්ත් නුවර Kenwick වල පිහිටුවීමෙන් පසු 10 වන වරටත් වසර අවසන සත්දින පිරිත් පිංකම 2009 වසරේත් අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වුණා. මෙවරත් දෙසැ 2 පටන්ගෙන ජන 01 දක්වා දිනපතා මේ පිංකම පැවැත්වුණා. මෙම පිරිත් පිංකම පර්ත් පංසලේ අලුත් විහාර මන්දිරය විවෘත කිරීමෙන් පසු 5 වන වාර්ෂික පිරිත් පිංකම බව මට දැනගන්නට ලැබුණා. ඒ වෙනුවෙන් දර්ශනීය පිරිත් මණ්ඩපයක් ඉදිකර තිබුණා. මේ පිංකමේ විශේෂත්වය පස්වෙනි වරටත් ඒ සඳහා අලුත්ම පිරිත් මණ්ඩපයක් නිර්මාණය කිරීමයි. සිරිත් පරිදි මේ වතාවෙත් පිරිත් මණ්ඩපය නිර්මාණය කළේ චන්ද්‍රදාස හේවගේ මහතා. දර්ශනීය නිර්මාණයක් වූ මෙම මණ්ඩපය පිළිබඳ පාඨක ඔබට යම් පැහැදිලි කිරීමක් සිදුකිරීම වටිනා දෙයක් සේ සැළකූ මා ඔහු හා මේ නිර්මාණය ගැන විමසන්නට පිරිත් පිංකමට සහභාගී වූ හාමුදුරුනමක් හැඩියට අදහස් කළා. එනිසා මේ ගැන චන්ද්‍රදාස හේවගේ මහතාගෙන් පළමුව කරුණු විමසීමක් කළා.

මේ මණ්ඩපයේ නිර්මාණකරු වශයෙන් ඔබට යම් පැහැදිලි කිරීමක් කළ හැකිද?

හාමුදුරුවනේ, සාමාන්‍යයෙන් පන්සල්වල, ධර්මශාලාවල පිරිත් මණ්ඩප ඉඳි කෙරුනත් විහාර ගෙයක් තුළ පිරිත් මණ්ඩපයක් තැනෙන්නේ කලාතුරකින්. බුදුමැදුර තුළ නේත්‍රා තැබූ බුදු පිළිමයයි ප්‍රධාන වන්දනීය වස්තුව. ඒ වගේ පිරිත් මණ්ඩපයට සර්වඥ ධාතූන් වහන්සේලා ප්‍රධාන තෙරුවන් වැඩම කරන නිසා බුදු මැදුරක් තුළ පිරිත් මණ්ඩපයක් තැනීමේදී මේ පූජනීය වස්තූන් දෙකටම නිගරු නොවන ලෙස පිරිත් මණ්ඩපය ස්ථානගත කළ යුතුයි. එය නිර්මාණකරුගේ මූලික වගකීමක්. බුදුමැදුර තුළ ඉඩ ලබා ගැනීමේ අදහසින් මණ්ඩපය මුල්ලක ඉඳිකිරීම හොඳ නැහැ. ඒ කියන්නේ බුදුමැදුර තුළ බිම් කොටස් හතරකට බෙදූ විට එයින් තනි කොටසක පමණක් ඉඳිවිය යුතු නැහැ. මණ්ඩපය ඉන් කොටස් දෙකකට අයිති වෙන්න ඕන. එනිසා මගේ මූලික අවධානය යොමු කළේ මණ්ඩපය ස්ථානගත කළයුතු තැන පිළිබඳවයි. ඉන් අනතුරුවයි අනෙක් සැළසුම් සකස් කරන්නේ. එහෙම නොවුනොත් එය තෙරුවන්ට කරන නිගරුවක් බවට පත් වෙනවා. ඊලඟට තෝරාගත් ස්ථාන හැඩියට නිමාව කෙසේ වීය යුතුදැයි සැළසුම් කරනවා.

මේ නිර්මාණයට කොපමණ කාලයක් ගත වුවාද?

ආරම්භයේ ඉඳලම බැලුවොත් මාස 2 1/2 පමණ කාලයක් ගතවී තිබෙනවා. ඒත් මුල් දවස්වල සති 3ක් පමණ දවසකට පැය දෙකක් තරම් කාලයක් ගත කරමින් මෙහි සැළසුම් කටයුතු සකස් කළා. මෙහි කිසිම වීදිහේ දැව හෝ ලෝහ සැකිල්ලක් යොදාගෙන නැහැ. සැකිල්ල තනිකරම කාඩ්බෝඩ් පමණයි. එනිසා සැකිල්ල නිර්මාණයේදී පරිගණකයෙන් සෑහෙන වැඩ කොටසක් කරගන්නවා. ඊලඟට පරිගණක සටහන් BOX MAKER කෙනෙකුට දෙනවා. මේ මණ්ඩපය දක්වා පිරිත් මණ්ඩප පහේම ඒ කාර්යය කළේ එකම BOX MAKER කෙනෙකු නිසා ඔහුට සෑහෙන වැටහීමක් මේ ගැන තිබීම මට ගොඩක් පහසු වුනා.

ඉන් අනතුරුව එළඹෙන්නේ දෙවන අදියරයි. විහාරාධිපති ගරු බේරුවල සෝභිත හිමියන් අප කණ්ඩායම දිරිමත් කරමින් වැඩ ආරම්භ කිරීමට පළමුව පිරිත් පරිදි තෙරුවන් වන්දනා කර පිරිත් දේශනා කරලා ආශිර්වාද කළා. දෙවන අදියරේදී EVENT COORDINATOR හැඩියට අනුර විජේවර්ධන පතුගිය අවුරුදුවල වගේම මෙවරත් ඒ වැඩ කොටස වගකීමෙන් ඉටුකළා. මෙවර අනුර විජේවර්ධනට සහයට සුදත් රණසිංහ, කපිල - කාංචනා කටුලන්ද යුවළ චන්ද්‍ර - ඉන්දුනි අබේසූරිය යුවළ, සමන්ත/චමී අබේවික්‍රම පියපුත් දෙපළ, රත්න රූපසිංහ, අපිත් මාතොට, සමන්ත රත්නසිරි, අජන්ත ලියනගේ, දෙවන අදියරේදී මේ කොටස් පෙට්ටි වීදිහට හඳලා වර්ණ ගන්වනවා.

එතකොට කැටයම් එකතු කරන්නෙ

ඊලඟ අවස්ථාවේදී තමයි කැටයම් ආකෘති එකතු කරන්නේ. මේ අවස්ථාවේදී මට සහාය වුනා මගේ සොහොයුරු සරත් අනු. ඊලඟට ඒවා සකස් කිරීමේදී ඉහත් සඳහන් පිරිසට තවත් පිරිසක් එකතු වුනා. ඒ අයත් හැම අවුරුද්දෙම මෙයට එකතු වෙන්න පිංකල අය. දර්ශන - දිනු ජයසිංහ යුවළ, සම්පත් දයාරත්න ඉඳුනිල් ගයනි හෙට්ටිගේ යුවළ, ඉෂාරා නදීෂා හෙට්ටිගේ මෙනෙවිය, ඉන්දික රූපසිංහ, සුරාජ් එගොඩගහ, අනුර විජේවර්ධනගේ දියණි තිළිණිත්, මගේ දියණි චන්දිමා මෙයට සහභාගි වුනා. ඊලඟට මේ අවුරුද්දෙ කණ්ඩායමට අලුතෙන් එක්වුනා යසන්ත ආරියරත්න, දම්තා/චතුරි ජයවර්ධන යුවළ හා අරුණ ප්‍රියන්ත.

මේ නිර්මාණයට කාලයත්, ශ්‍රමයත් හුඟක් වැය කරන්න වෙනවා. ඉවසීමෙන් හා පිළිවෙලකට කළයුතු දෙයක් නිසයි එහෙම වෙන්නෙ. මාත් එක්ක එකතු වුනු හැම කෙනෙක්ම ඉවසීමෙන් පිළිවෙලකට වැඩ කිරීම ලොකු සතුටක් ගෙවේරියයක්.

මේ නිර්මාණය දැක්කම මට හිතෙනවා ස්ථිර මණ්ඩපයක් හදලා තියාගන්න බැරිද කියලා.

එහෙමයි, ඒක මුදල්, කාලය, ශ්‍රමය ඉතිරි කරගන්න පුළුවන් ප්‍රයෝගයක්. ඒත් මමත් මේ පිරිසත් එකතු වෙලා මේ දේ කරන්නේ එය තුණුරුවන්ට කරන පූජාවක් හැටියට. අපි කවදත් තුණුරුවන්ට පූජා කරන්නේ නැවුම් දෙයක් නේද? මේ වසරේ අපේ ප්‍රධාන මූර්තිය හැටියට මකර තොරණයි යොදා ගත්තෙ. ඒවගේම පෙරණි සිංහල ගොඩනැගිල්ලක ආකෘතියක් විධිහට මෙය ඉදිකලා. ගිය වසරේදී අපි අපේ ශ්‍රී ලංකාවේ පැරණි කලා සම්ප්‍රදාය හැටියට වාමන රූප දොරවුපාල රූප යොදා ගත්තා. ඊට කලින් අවුරුද්දෙ ගොක් කොළ කලාව කඩදාසිවලින් නිරූපනය කරමින් ශ්‍රී ලංකාවේ ගොක් කලා සම්ප්‍රදාය මෙහාට ගෙන ආවා. ඒ කියන්නේ මේ නිර්මාණ අවුරුද්දෙන් අවුරුද්දට අලුත් වෙමින් ඉදිරියට යනවා. මෙයට දායක වන හැමෝම බොහෝම ආශාවෙන් හා ඉවසීමෙන් කාලය කැප කරනවා. අලුත් කට්ටිය එකතු වෙනවා. කලාත්මක දේවල්වලට කැමති අය කලාවට අත තුරුසාර ගත්තා. ඒවගේම අපි හැම කෙනෙක්ම මොනවාහරි වැදගත් දෙයක් ඉගෙන ගන්නවා. අපට අමතක කරන්න බැහැ. බුදු දහම හා පන්සල නිසයි ලංකාවේ කලා ශිල්ප හා ගෘහ නිර්මාණ ශිල්පය ආරක්ෂා වුනෙත් දියුණු වුනෙත් කියලා. මෙහි ඉතා වැදගත් දේ තමයි 1000 ට වඩා වැඩි පිරිසක් මෙය දැකබලා සතුටු වීය. ලංකාවෙ ඉපදුණු ලංකාවෙන් ආ හැමදෙනාම මේ වගේ දේවල් දැකලා තිබෙන නිසා මේ රටේදී ඒවා දකින්න ලැබුනම හරි සතුටක් ඇති වෙනවා. හරියට කලකින් නුදුටු ප්‍රියමනාප කෙනෙක් හමුවුනා වගේ. ලඟට ඇවිල්ලා අතගාලත් බලනවා. අපි එක රාමුවක් හදාගෙන හැම අවුරුද්දෙම කොල අලුව අලුව තියාගත්තා නම් එයින් කාලය, ශ්‍රමය, මුදල් ඉතිරි කලාට මේ වගේ තාප්තියක් ලැබෙන්නෙ නැහැ. තුනුරුවන්ට කරන පිරිසිදු පූජාවක් වෙන්නෙත් නැහැ.

විශේෂයෙන් මේ මකර තොරණ යොදා ගත්ත එක ගැන සඳහන් කලොත්

මකර තොරණ කියන්නෙ පන්සල් දේවාලවල යොදා ගත්ත කලාත්මක කැටයමක් සම්ප්‍රදායික කිව්සි මුනත්, දෙපසින් මකරුන් දෙන්නත් මේ කැටයමේ මූලික කොටස, කිව්සි මුන කියන්නේ රාහු අසුරයගේ වේශයක්ලු. අකෙක මකරුන් දෙන්නා සෑදී තියෙන්නේ සතුන් කීප දෙනෙකුගේ උපාංග එකතුවෙන්. අලිහොඬය, කිඹුල් දත්, වසුරු ඇස්, ඌරු කන්, මත්ස්‍ය ශරීරය, සිංහ පාද. මේක පන්සල්වල හා දේවාලවල දොස් ඇරලන්නත් ආරක්ෂාව සඳහාත් යොදා ගත්ත කලාත්මක නිර්මාණයක්.

ලංකා ඉතිහාසයේ එක් එක් යුගවල ගලින් හා දැවයෙන් මකර තොරණ නිර්මාණය කරලා තිබෙනවා. කොහොමත් මා කලින් කී කාලය ලංකාවේ ගෘහ නිර්මාණය හා කලා ශිල්ප දියුණු වෙලා මේ විධිහට පවතින්නෙ බුදු දහමේ ඇසුර නිසයි. අපිත් මෙහේදී උත්සාහ කරන්නෙ ගලින් දැවයෙන් නොවුනත් අපේ කලා ශිල්ප අමතක නොකර තියාගන්න. මට අවසාන වශයෙන් කියන්න තියෙන්නේ පර්ත් ශ්‍රී ලංකා බෞද්ධ විහාර සංගමය මේ සඳහා ප්‍රතිපාදන ලබා දෙනවා. දැනට වසර පහක් තිස්සේ මේ නිර්මාණ කරගෙන එනවා. අපේ මේ කණ්ඩායම එකතුවෙලා දැන් අවුරුදු දෙකයි. වෙසක් උත්සවය සඳහා විශාල කැරකෙන පහන් කූඩු දෙකක් නිර්මාණය කළා. ඒවා විශාල පිරිසකගෙ ප්‍රසාදයට ලක් වුනා. මේ හැම දෙයකදීම මා සමග අනුර විජේවර්ධන අතලුතු මා කලින් සඳහන් කළ කණ්ඩායම නැත්නම් මට මේවා එකක්වත් කරන්න බැහැ.

ඔබෙන් පස්සෙ මේ කලාව කවුද මේ වීදිහට ගෙනියන්නේ

අප දිගටම කරගෙන ආ නිර්මාණවලට සම්බන්ධ වෙච්චි අය තම තමන්ගේ කුසලතාවල හැටියට අළුත් දෙයක් ඉගෙනගෙන තියෙනවා. ඒ අයට මේ සඳහා ආශාව තියෙනවා. මේ විධිහට උදව්වට එන කවුරුහරි නිසා මෙය ඉදිරියටම පවතිවී.

දෙවනුව මේ පිරිත් මණ්ඩපයේ සියලු සම්බන්ධීකරණ කටයුතු කළ අනුර විජේවර්ධන මහතාගෙන් ද කරුණු විමසීමක් කළා.

ඔහු සඳහන් කළේ ඃ- මේ මණ්ඩපය ගොඩනැගීම සඳහා පර්ත් නුවර වෙසෙන විශාල පිරිසකගේ සහභාගීත්වය හා දායකත්වය ලැබෙනවා. නමුත් මේ තුළ මා දකින සහභාගී වීමට වඩා දෙයක් තිබෙනවා. මෙයට උදව් වන හැමදෙනාම පොදු දෙයක්ය යන හැඟීම ඇතිවයි වැඩ කරන්නේ. මෙය පන්සල් භූමිය තුළ බුදු මැදුරේ සිදුවන නිසාත් ඉමහත් භක්තියකින් හා ගෞරවයකින් සිදුවන නිසාත්, සෙත් පැතීමේ ආගමික වතාවතක් නිසාත් ඉමහත් භක්තියකින් හා ගෞරවයකින් පිරිස සහභාගි වෙනවා. මෙයට සහභාගි වන පිරිස සමාජය පුරා විසිරී සිටින විවිධ පුද්ගලයන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, රැකියා කරන අය, විශ්‍රාමිකයන්, අලුත් සංක්‍රමණිකයන්, ඒ අතර සමහරු පවුලේ සියලු දෙනා සමඟම සහභාගි වෙනවා. මෙමගින් ඔවුනොවුන් හඳුනා ගැනීම නව සබඳතා ගොඩනැගීමත් සිදුවෙනවා. වෙනත් වැඩවලදී සතියේ දිනවල විවේකයක් නැතිබව කිව්වත් මාස 2 ට ආසන්න කාලයක් තුල මේ හැමකෙනෙක්ම තම තමන්ගේ වැඩකටයුතු අතහැර වී සමහර දිනවල මධ්‍යම රාත්‍රිය පහුවන තෙක්ම වැඩවල යෙදෙනවා. මා හිතන්නේ ආශාවෙන් කරන නිසාත් මානසික තෘප්තියක් - ආශ්වාදයක් ලබන නිසාත් එහෙම වෙන්නෙ කියලා. කැටයම් කැපීම ගැන කිසිම අත්දැකීමක් නැති බොහෝ දෙනා අද කැටයම් කැපීමත් සිදු කරනවා. මෙය ඉතා සංයමයෙන් හා ඉවසීමෙන් කළයුතු දෙයක්. මෙයත් පතුගිය අවුරුදු කිහිපය තුල අප ලැබූ විශාල ජයග්‍රහණයක් ලෙස සළකන්න පුළුවන්. මෙවැනි කටයුත්තක් මුදල් තිබූ පමණින්ම කරන්නට බැහැ. එසේ කලත් වරකට දෙවරකට වඩා ඉදිරියට යන්න අපහසුයි. නමුත් සහභාගි වන හැම දෙනාගේම එකතුවූ බව හා පොදු වැඩක්ය යන හැඟීම මෙය නොකඩවා ඉදිරියට කරගෙන යන්න හැකියාව ලැබී තිබෙනවා.

අවසාන වශයෙන් මෙයට සහභාගී වූ සැමට ස්තූතිය පිරිනමමිවා.

අවසානයේ දී මා කතා කෙළේ ගරු විහාරාධිපති බේරුවල සෝභිත හිමියන් සමඟයි.

හාමුදුරුවනේ, ඔබ වහන්සේ මේ පන්සලට ඇවිත් අවුරුදු 10 ට ආසන්නයි. මේ කාලය තුල බෞද්ධ ජනතාවගේ ආගමික වත් පිළිවෙත්වල යෙදීම පමණක් නොවෙය ලාංකික සිරිත් විරිත්, භාෂාව, කලා ශිල්ප රැකගන්න කැප කිරීමක් කරන බව පෙනෙනවා. මේ සඳහා ඔබ වහන්සේට ලැබෙන අනුග්‍රහයන් ගැන සඳහන් කළොත්

හාමුදුරුවනේ ලාංකික සිරිත් විරිත් භාෂාව හා කලා ශිල්පවල වටිනාකම හඳුනාගත් මේ රටේ සිංහල බෞද්ධ අය අප අතර ඉන්නවා. ඒ අය ඒකරාශි කරගෙන ඔවුන්ගේ අනුග්‍රහය ලබා ගන්න හැකිවීම සතුටට කරුණක්. අවංක සිතින් යමක් කරනවිට අනුග්‍රහ දක්වන සත්පුරුෂ පින්වතුන් ඉන්නවා.

බෞද්ධ නොවන අයගේත් සහයෝගය මෙවැනි කටයුතුවලට ලැබෙනවාද?

හාමාව - කලාව එක ආගමකට - ජාතියකට සීමා වූ දේවල් නොවේ. එනිසා මෙවැනි කටයුතුවලට කිසිම භේදයකින් තොරව මේ දේවල්වලට අගය දන්න කාගේත් සහයෝගය ලැබෙනවා. අප විහාරස්ථානයේ දායක සභාවේ සම්පූර්ණ අනුග්‍රහය නිරතුරුවම මෙවැනි කටයුතුවලට ලැබෙනවා. එය අපට ඉමහත් ශක්තියක්.

උසස් කලා නිර්මාණ නිහිවන්නේ හොඳ මානසික වටපිටාවක් ඇති අයගෙන්. ඒවගේම එවඳු නිර්මාණවල යෙදීමත් මනසේ එක්තැන් බවට සංවරයට හේතු වෙනවා. එනිසා අප මෙවැනි නිර්මාණ අගය කළ යුතුයි. ආගමික සේවාව මෙන්ම මෙවන් කලාත්මක නිර්මාණ බොදු බැතිය දියුණු කරන්නත් අනන්‍යය සුහද බව පතුවුරු වන්නටත් හේතු වෙනවා.

මා දකින මේ සියලු කටයුතු අතරේ ඇති විශේෂ දෙය නම් මේ මණ්ඩපය අතුළු සියලු කලා නිර්මාණවලදී චන්ද්‍රදාස හේවගේ නම් නිර්මාණකරුවා සියලු නිර්මාණ පොදු නිර්මාණ බවට පත් කිරීමට ගන්නා උත්සාහයයි. සියලු දෙනාටම පිං දෙමි.

ඕස්ට්‍රේලියාවේ සංචාරයක් සඳහා පැමිණි මට පර්ත් නුවර ශ්‍රී ලංකා බෞද්ධ විහාරයේ දින කිහිපයක් නේවාසික සිටීමටත්, ආගමික කටයුතු කිහිපයකට සහභාගී වීමටත් හැකිවීය. ඒ අතර වසර අවසානයේ පැවැත්වූ සත්දින පිරිත් පිංකමට සහභාගී වීමට ලැබීම උතුම් කොට සළකමි. විහාරාධිපති පූජ්‍ය බේරුවල සෝභිත හිමියන්ගේ මග පෙන්වීම යටතේ දායක පිරිස ඉතා කැපවීමෙන් විහාරස්ථානයේ කටයුතුවලට සහභාගී වීම අගය කළ යුතුය. පිරිත් මණ්ඩපය ඉතා විසිතුරු අයුරින් නිර්මාණය කර තිබීම බොදු බැතිය දියුණු වන්නට හේතුවීය. ලාංකීය පරාණි කැටයම් කලාව ලොවට ප්‍රදර්ශනය කරන්නට මෙය මාහඟෙ අවස්ථාවක් වීය. දහසකට වැඩි පිරිසක් මෙම පිංකම සඳහා සහභාගී වූහ. ඉදිරියටත් මෙවැනි කටයුතු තුළින් ලාංකීය බෞද්ධ කලා ශිල්ප රැකගැනීමටත් ලොවට පෙන්වීමටත් සංවිධායකවරුන්ට කායික මානසික ශක්තිය දියුණු වේවායි පතමි.

පූජ්‍ය බෝතලේ රාහුල හිමි

> ඒක මුදල්, කාලය, ශ්‍රමය ඉතිරි කරගන්න පුළුවන් ප්‍රයෝගයක්. ඒත් මමත් මේ පිරිසත් එකතු වෙලා මේ දේ කරන්නේ එය තුණුරුවන්ට කරන පූජාවක් හැටියට. අපි කවදත් තුණුරුවන්ට පූජා කරන්නේ නැවුම් දෙයක් නේද? මේ වසරේ අපේ ප්‍රධාන මූර්තිය හැටියට මකර තොරණයි යොදා ගත්තෙ. ඒවගේම පෙරණි සිංහල ගොඩනැගිල්ලක ආකෘතියක් විධිහට මෙය ඉදිකලා. ගිය වසරේදී අපි අපේ ශ්‍රී ලංකාවේ පැරණි කලා සම්ප්‍රදාය හැටියට වාමන රූප දොරවුපාල රූප යොදා ගත්තා. ඊට කලින් අවුරුද්දෙ ගොක් කොළ කලාව කඩදාසිවලින් නිරූපනය කරමින් ශ්‍රී ලංකාවේ ගොක් කලා සම්ප්‍රදාය මෙහාට ගෙන ආවා. ඒ කියන්නේ මේ නිර්මාණ අවුරුද්දෙන් අවුරුද්දට අලුත් වෙමින් ඉදිරියට යනවා.